# කොළඹ දිස්ත්‍රික් වෘත්තීය ඡායාරූප ශාලා හිමියන්ගේ සංගමයේ පළමු මහා සභා රැස්වීම් වාර්තාව.

## 26-07-2020

වර්ෂ 2020 ක්වූ ජූලි මස 26 දින ප.ව 3.10 ආරාධිත අමුත්තන්ට බුලත් හුරුළු ලබාදී පිළිගැනීමෙන් සභාව වෙත කැඳවා ගෙන පැමිණීමෙන් අනතුරුව කොළඹ දිස්ත්‍රික්කයේ කොට්ඨාශ 13 නියෝජනය කරමින් පැමිණ සිටි සියළුම ඡායාරූපශාලා හිමියන් සභාවේ අසුන් ගත්තේය. පසුව ප්‍රථමයෙන්ම නික්සන් ඇඹුල්දෙණිය මහතා විසින් අද දින අප සංගමය ආරම්භ කිරීමේ රැස්වීම මෙහෙයවීම සඳහා ප්‍රවීන නිවේදක කුලසිරි ජයකොඩි කිවිඳාණන්ට ආරාධනා කලේය.

ඔහු විසින් කවියෙන් සභාව ආමන්ත්‍රණය කරමින් න්‍යායපත්‍රයට අනුකූලව පළමුව පොල්තෙල් පහන දැල්වීම සඳහා පැමිණි සිටි ආරාධිතයින්ට ආරාධනා කිරිමට සූදානම් වෙමින් පවසා සිටියේ, මෙහි පැමිණි ඔබ සියළුදෙනාට අපට සුවිශේෂී පුද්ගලයන් බවත් නමුත් පොල්තෙල් පහනේ තිර සීමිත බැවින් මා පහත නම් කරන ආරාධිතයින්ට ගෞරවයෙන් පොල්තෙල් පහන් සිළු දැල්වීමට ආරාධනා කරන බවයි. ඒ අනුව රාජ්‍ය ඡායාරූප උපදේශක සභාවේ ගරු සභාපති ප්‍රසන්න හෙන්නායක මැතිතුමාට, රාජ්‍ය ඡායාරූප උපදේශක සභාවේ ගරු උප සභාපති, නිෂාන් අලගේවත්ත මැතිතුමාට, කර්මාන්ත සංවර්ධන අමාත්‍යංශයේ ව්‍යවසාය සංවර්ධන මණ්ඩලයේ සභාපති සහ camera.lk ආයතනයේ සභාපති අනුෂ්ක ගුණසිංහ මැතිතුමාට, නයින්හාර්ට්ස් සමූහ ව්‍යාපාරයේ සභාපති තිලක් ගොඩමාන්න මැතිතුමාට ද කථිකාචාර්ය අනිල් ලසන් පෙරේරා මැතිතුමාට, සොෆ්නෙට් වර්ණ රසායනාගාරයේ උපුල් මැතිතුමාට, ඩීබග් ආයතනයේ වුඩ්න් මෝසෙස් මැතිතුමාට ද, සොෆ්ලොජික් ආයතනයේ සෆ්රූන් මැතිතුමාට ද, ටෂ්මා ස්ටුඩියෝ අධිපති රනිල් රූපසිංහ මැතිතුමාට ද, ලංකා ස්ටුඩියෝ අධිපති මනෝරි ලංකා මහත්මියට ද ආරාධනා කරනු ලැබීය. ඉන් පසු ජාතික ගීය ගායනාකිරීමෙන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවයකින් පසු පළමුව පිලිගැනීමේ කථාව සහ අරමුණ පැහැදිලි කරමින් ටෂ්මා ස්ටුඩියෝ අධිපති රනිල් රූපසිංහ මහතා විසින් පවසනු ලැබුයේ, ඡායාරූප ශාලා හිමියන්ගේ වෘත්තීය අයිතිවාසිකම්, ආයතනික දියුණුව සහ සුභසාධක වැඩපිළිවෙල් ඇති කරගැනීම සහ ව්‍යවස්ථාවේ ඇති පරමාර්ථ ඉටුකර ගැනීම පිණිස අපගේ එකමුතුවක් අපට අවශ්‍ය බව කැඳවීම් කමිටුව හතර වතාවක් රැස්වීමෙන් අපට තේරුම් ගිය බවයි. ඉන් පසුව නිවේදකතුමා විසින් ප්‍රථම ආරාධිත දේශනය සඳහා ආරාධනු කරනු ලැබුයේ ජාතික ඡායාරූප උපදේශක සභාවේ සභාපති සහ අග්‍රාමාත්‍ය මාධ්‍ය ඒකකයේ අධ්‍යක්ෂ ප්‍රසන්න හෙන්නායක මැතිතුමාවය. එතුමා පළමුව නිවේදකතුමාගේ ඉල්ලීම පරිදි කාලය කළමනාකරමින් නිවේදකතුමා පොල්තෙල් පහන දැල්වීමට ආරාධනා කරනු ලැබූ සියළු ආරාධිතයින්ගෙන් සහ පැමිණි සියළු දෙනාගෙන් අවරස පැතීය. පසුව සමනල උත්සව ශාලාවේ පැවති පළමු කැඳවීම් කමිටු රැස්වීමට ඔහුටද සහභාගී වීමට හැකි වුණ බවද මෙම කැඳවීමේ කමිටුවේ සියළුදෙනාගේ කැපවීම එතුමාද එකතු වී ඇති වට්ස්ඇප් ගෘප් එක තුලින් නිතිපතා දැක ගැනීමට හැකි වූ බවද පවසා සිටියේය. වැඩිදුරටත් එතුමා පවසා සිටියේ, කොළඹ දිස්ත්‍රික්ක සංගමය ඉතාම ශක්තිමත්ව ගොඩනඟා ගැනීමට ඔහුගේ නිබඳ සහය අප වෙත

ලබාදෙන බවය. රජයෙන් රු.500,000/- ණය පහසුකමක් මේ වනවිට ඡායාරූප ශිල්පීන්ට ලබාදීමට කටයුතු කිරීමේදී ඒ වෙනුවෙන් විශාල කාර්යයභාරයක් ඉටුකිරීමට ඔහුට හැකිවීම පිළිබඳව සිදුවන බවද පවසා සිටියේය.

දෙවනුව ආරාධිත දේශනා සඳහා කර්මාන්ත අමාත්‍යංශයේ ජාතික ව්‍යවසාය කමිටුවේ සභාපති සහ camera.lk ආයතනයේ සභාපති අනුෂ්ක ගුණසිංහ මැතිතුමා සභාව අමතමින් පවසා සිටියේ, ඡායාරූප ශාලා සුරැකීම වෙනුවෙන් විමල් වීරවංශ අමාත්‍යවරයා සමඟ එක්වී කටයුතු කල බවත් ඡායාරූප ක්ෂෙත්‍රයේ දිගු අතීතයකි. උරුමක්කාරකමක් තමාට අම්ල වර්ණ රසායනාගාරය නිසා හිමිවී ඇති බැවින් අප සංගමයේ සාමාජික අයිතිවාසිකම් ඉටුකර ගැනීමේදී නිබඳ සහය අප හට ලබාදෙන බවය.

න්‍යායපත්‍රානුකූලව ඉන්පසු එළඹුනේ, සංගමයේ ප්‍රථම නිලවරණය පැවැත්වීම පිළිබඳ කටයුතු කිරීමට ඒ සඳහා නිවේදකතුමන් විසින් තිමති ස්ටුඩියෝ අධිපති මිත්‍රකුමාර ජයසිංහ මහතාට මුලාසනය භාරදෙන ලදී. එතුමා විසින් සියළුදෙනාගෙන්ම අවසර ගැනීමෙන් අනතුරුව පළමුව ලේකම්වරයෙකු පත් කර ගන්නා ලෙස දැනුම්දුන්නේය. එහි දී නැගී සිටි කිත්සිරි මහතා විසින් නික්සන් ඇඹුල්දෙණිය මහතා ලේකම් තනතුරට සුදුසු යැයි යෝජනා කරනු ලදුව සේනක තෝමස් මහතා ස්ථිර කරනු ලැබුවේය. ලේකම්තුමා වැඩ භාර ගැනීමෙන් අනතුරුව මුලාසනය භාර මිත්‍රකුමාර මහතා විසින් පවසනු ලැබුවේ සභාපතිවරයෙකු පත්කර ගන්නා ලෙසය. එහිදී නැගී සිටි සේනක තෝමස් මහතා රනිල් රූපසිංහ මහතා සුදුසු යැයි යෝජනා කරනු ලදුව සදුන් මහතා විසින් ස්ථිර කරන ලද්දේය. පසුව පිළිවෙලින් භාන්ඩාගාරික ලෙස නුවන් රණසිංහ මහතා සුදුසු යැයි වර්ණක මහතා යෝජනා කල අතර, චමිල මහතා විසින් ස්ථිර කලේය. ප්‍රධාන සංවිධායක ලෙස ලක්මාල් සිල්වා මහතා සුදුසු යැයි සිරෝමා තලවත්තේ මහත්මිය සුදුසු යැයි යෝජනා කළ අතර එය ෂාමි මහතා විසින් ස්ථිර කලේය. ගිණුම් පරීක්ෂක ලෙස මනෝරි ලංකා මහත්මිය සුදුස බව ගාමිණී පුෂ්පකුමාර මහතා විසින් යෝජනා කරනු ලදුව වර්ණක මහතා විසින් ස්ථිර කලේය. සුබ සාධක ලේකම් ලෙස චමිල මහතා සුදුසු යැයි සදුන් මහතා යෝජනා කල අතර සේනක තෝමස් මහතා එය ස්ථිර කලේය. උප සභාපති ලෙස හරේන් ජයවර්ධන මහතා සුදුසු යැයි මානෙත් කොඩිකාර මහතා යෝජනා කල අතර රවි පෙරේරා මහතා විසින් ස්ථිර කරන ලද්දේය. උප ලේකම් ලෙස කමල් සුබසිංහ මහතා සුදුසු යැයි මානෙල් මහත්මිය විසින් යෝජනා කළ අතර එය කිත්සිරි මහතා විසින් ස්ථිර කරනැ ලැබුවේය. උප සුභ සාධක ලේකම් ලෙස අජිත් මහතා සුදුසු යැයි සුමින්ද්‍ර විජේසිංහ මහතා යෝජනා කල අතර සුසන්ති සමරසිංහ මහතා විසින් ස්ථිර කරනු ලැබුවේය. එම සංවිධායකවරුන් ලෙස වසන්ත වර්ණක මහතාව මිලාන් වීරරත්න මහතා යෝජනා කල අතර සමන් නන්දන මහතා විසින් ස්ථිර කරනු ලැබුවේය. සම සංවිධායක ලෙස ෂාමි සෙයිනුඩීන් මහතා සුදුසු බව සරත් සේරම් මහතා යෝජනා කල අතර ප්‍රසන්න වේරගල මහතා විසින් ස්ථිර කලේය. සම සංවිධායක ලෙස කිත්සිරි සෙනෙවිරත්න මහතාව මියුරු ගුණසිංහ මහතා යෝජනා කල අතර සමන් නන්දන මහතා ස්ථිර කලේය. මෙසේ විධායක සභාවට නිලධාරීන් 13 දෙනෙකු පත්කර ගැනීමෙන් අනතුරුව මුලාසනය විසින් පවසනු ලද්දේ, කොට්ඨාශ 13 නියෝජනය කරමින් කාරක සභිකයින් 32ක් පත්කරගන්නා ලෙසය. එහිදී පත් වූ ලේකම් නැගී සිට යෝජනා

කරන ලද්දේ කැඳවීමේ කමිටුවේ කටයුතු කළ සියළුදෙනා කාරක සභාවට පත් කිරීම සුදුසු බවය. ඒ අනුව ඔහු විසින් පහත නම් යෝජනා කරන ලද්දේය. කොළඹ කොට්ඨාශයෙන් සමන් නන්දන මහතා, ශිරෝමි තලවත්තේ මිය, පී. ජීවනේෂන් මහතා, සේනක තෝමස් මහතා, තිඹිරිගස්යාය කොට්ඨාශයෙන් නලින් ප්‍රේමලාල් මහතා, එම්. මිත්‍ර කුමාර මහතා, කේ. මොහොන්රාජ් මහතා, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ කොට්ඨාශයෙන් මිලාන් වීරරත්න මහතා, කඩුවෙල කොට්ඨාශයෙන් ආර්.එච්.ජයන්ත මහතා, සරත් සේරම් මයා, වී. රමණී ශ්‍රී පාලි මිය, ප්‍රසන්න වේරගල මහතා, දෙහිවල කොට්ඨාශයෙන් නිශාන්ත සුරේෂ් මයා, රවි පෙරේරා මයා, රත්මලාන කොට්ඨාශයෙන් මියුරු ගුණසිංහ මයා, මොරටුව කොට්ඨාශයෙන් මානෙල් පෙරේරා මිය, චන්දන තලකුඹුර මහතා, මහරගම කොට්ඨාශයෙන් එච්.ඒ.උපුල් චන්දන මහතා, එස්. ලක්මාල් මහතා, ආර්. උදය මහතා, සුමින්ද විජේසිංහ මහතා, හෝමාගම කොට්ඨාශයෙන් සුසන්ත සමරසිංහ මහතා, ප්‍රියන්ත ගුණතිලක මහතා, සීතාවක කොට්ඨාශයෙන් සුනිල් පල්ලාවල මයා, ජේලිනා ඒකනායක මිය, පාදුක්ක කොට්ඨාශයෙන් ගාමිණි පුෂ්පකුමාර මයා, දිලිප් ගාමිණී ඩයස් මහතා, කොලොන්නාව කොට්ඨාශයෙන් උදාරි කල්පනා මිය, කලන සුබෝධ මයා, කැස්බෑව කොට්ඨාශය නියෝජනය කරමින් මානෙත් කොඩිකාර මහතා, සුරංග ගැටවකන්දගේ මහතා, සහ සරත් විජේනන්දන යන සාමාජකයින් නික්ෂන් ඇඹුල්දෙනිය මහතා විසින් යෝජනා කරන ලදුව සේනක තෝමස් මහතා විසින් ස්ථිර කරන ලදී.

මීළඟට සාකච්ඡාවට බඳුන්වූයේ අප සංගමයේ අරමුදල් ශක්තිමත් කර ගැනීම පිණිස සිදුකල යුතු ව්‍යාප්ති කවරේද යන වගය. එහි දී නොයෙක් අදහස් කාරක සභිකයින්ගෙන් සහ නිලධාරී මණ්ඩලයෙන් ඉදිරිපත් වූ අතර අවසානයේ එකඟ වුයේ ඉදිරියේදී පවත්වන කාරක සභා රැස්වීම්වලදී ව්‍යාපෘති පිළිබඳ කමිටු පත්කොට ඒ සම්බන්ධව කටයුතු කරගෙන යාමට සුදුස බවය.

තවද, අප සංගමයේ මූල්‍ය කටයුතු පවත්වාගෙන යාමට සුදුසු බැංකුවක්, ව්‍යවස්ථාවේ සඳහන් ප්‍රතිපාදන අනුව යෝජනා ස්ථිර කරගන්නා ලෙස ලේකම්තුමා විසින් ප්‍රකාශ කලේය. එහිදී විවිධ නීති තර්ක ඉදිරිපත් කරමින් කාරක සභිකයින් අදහස් දැක්වීම සිදුකරන ලදී. දිවයිනේ දැනට ප්‍රමුඛ පෙළේ සිටින බැංකු 5ක නම් යෝජනා ඉදිරිපත් වූ අතර අවසානයේ දී සම සංවිධායක වසන්ත වර්ණක මහතා විසින් සම්පත් බැංකුවේ අප සංගමයේ ගිණුම් විවෘත කිරීම සුදුසු බව යෝජනා කලේය. එම යෝජනාව ශිරෝමි තලවත්තේ මහත්මිය විසින් ස්ථිර කලේය.

මීළඟට ලේකම්තුමා විසින් ව්‍යවස්ථාව යෝජනා ස්ථිර කර සම්මත කරගන්නා ලෙස දැනුම් දුන්නේය. ඒ අනුව ගාමිණී පුෂ්පකුමාර මහතාගේ යෝජනාවෙන් ද සුරංග ගැටවකන්දගේ මහතාගේ ස්ථිර කිරීමෙන්ද එය සම්මත විය. පසුව වාර්ෂික සාමාජික මුදල පිළිබඳව සාකච්ඡාවට ගැනුනු අතර එම අවස්ථාවේ නොයෙක් අදහස් සාකච්ඡා කොට අවසාන විසඳුම ලෙස 2020 වර්ෂය සාමාජික මුදල් එකතු කිරීම සිදු නොකිරීමටත් 2021 ජනවාරි මාසයේ සිට වාර්ෂිකව රු.2500/- මුදලක් සෑම සාමාජිකයෙකු විසින්ම සංගමයට ගෙවීමට සුදුසු බව ඒකමතිකව සම්මත විය.

ඉන්පසු එළඹුනේ, සමාජික නව අදහස් යෝජනා වාරයයි. එහිදී සේනක තෝමස් මහතා විසින් සඳහන් කරන්නට යෙදුනේ වාර්ෂික ක්‍රීඩා තරගයක් පැවැත්වීම සුදුසු බවය. තවද නොයෙක් අදහස් පිළිබඳව සාකච්ඡා කොට අවසානයේ දී වාර්ෂික වැඩපිළිවෙලක් සැකසීම සුදුසු බව ඒකමතිකව යෝජනා ස්ථිර විය. තව ප්‍රධාන සංවිධායක ලක්මාල් සිල්වා මහතාගේ යෝජනාව වුයේ ඉදිරි මාස කිහිපය ඇතුලත දැවැන්ත සුහද හමුවක් සහ ඇගැයීමේ උළෙලක් පැවැත්වීම සුදුස බවය. ලේකම් විසින් අගෝස්තු 19 වන දින ලෝක ඡායාරූප දින අප සංගමයට ආශිර්වාද පතා පිංකමක් කිරීම සුදුසු බව යෝජනා කළේය.

ඉන්පසුව තුන්වන ආරාධිත දේශනය නයින්හාර්ට්ස් සමුහ ව්‍යාපාරයේ සභාපති තිලක් ගොඩමාන්න මැතිතුමා විසින් සිදුකරන ලද්දේය. එහි දී ඔහු විසින් අප සංගමයේ නිලධාරීන්ට සහ කාරක සභිකයින්ට දැඩි අවවාද සිදු කරමින් සංගමය පවත්වා ගෙන යායුත්තේ කෙසේදැයි පවසන ලදී. තවද ඔහුගේ ව්‍යාපරය ආ ගමන්මග ද පැහැදිලි කරමින් ඔහුගේ පූර්ණ සහයෝගය අප වෙත ලබාදෙන බව පවසා සිටියේය.

පසුව අප සංගමයේ සාමාජික සහතික පත්‍රය සභාපති රනිල් රූපසිංහ මහතා විසින් ද හැඳුනුම්පත ලේකම් නික්සන් ඇඹුල්දෙණිය මහතා විසින් සංකේතවත් කරමින් නයින්හාර්ට්ස් සමුහ ව්‍යාපාරයේ සභාපති තිලක් ගොඩමාන්න මහතා වෙත පිරි නැමුවේය.

ඉන්පසුව හතරවන දේශනය ලේස ඩිජිමැක්ස් පුද්ගලික සමාගමේ සභාපති නිශාන් අලගේවත්ත මහතාට ආරාධනා කරනු ලැබුවේය. එතුමා සංගම් පිළිබඳව හසල දැනුම් ඇති අයෙකු ලෙස අප සංගමය දිවයිනේ අනෙකුත් සංගම්වලට ආදර්ශමත් ලෙස පවත්වාගෙන යාමෙන් විශිෂ්ඨ ගමනක් යා හැකි බවත් නිබඳව අප හට උපකාර කිරීමට කැපවන බවද සඳහන් කරන්නට යෙදුනි. ඉන්පසුව අප සංගමයේ අරමුදලට පළමු පරිත්‍යාගය ලෙස රු.25,000/- ප්‍රදානයක් තිලක් ගොඩමාන්න මැතිතුමා විසින් භාණ්ඩාගාරික නුවන් රණසිංහ මහතාට වෙත ප්‍රදානය කරන ලදී.

මේ වනවිට වේලාව ප.ව 5.10 පමණ වී තිබු අතර සභාවේ වැඩ කටයුතු අවසන් කරමින් ලේකම්තුමා විසින් සියළුදෙනාටම ස්තූතිකරමින් ස්තූති කථාව පවත්වන ලදී. අවසානයේ නිවේදක තුමා විසින් සමුහ ඡායාරූපයකට පෙනී සිටින ලෙස සියළුදෙනාටම ආරාධනා කර තේ පැන් සංග්‍රයක් ද බුක්ති විඳින ලෙස ආරාධනා කරමින් රැස්වීමේ වැඩ කටයුතු අවසන් කළේය.